සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 04

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරට යටින් ඉරක් ඇඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් ඇඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/I/S/CH

ලබා දෙන දිනය - 2026.06.23 පෙ.ව. 11.15 සිට ප.ව. 12.15 [දෙවැනි පිටුව බලන්න.

01. මල් වට්ටි හතරක රූප පහක් A, B, C, D, E මඟින් දැක්වේ. ඒවා අතරින් එක ම මල් වට්ටි දැක්වෙන රූප දෙක මොනවා ද?



A B C D E

(1) A සහ C (2) A සහ E (3) C සහ D

02. A රූපයට සමාන රූපයක් ලබා ගැනීමට B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?




A රූපය



B රූපය

(1) 3
(2) 4
(3) 5

03. මුලින් දී ඇති රූපය සකස් කිරීම සඳහා රූප කොටස් අතුරෙන් කුමන කොටස් දෙක යොදා ගත යුතු ද?




(1) C සහ D (2) A සහ B (3) B සහ C

04. මෙම කවියෙන් කියැවෙන අදහස සමග වඩාත් හොඳින් ගැළපෙන්නේ කුමක් ද?

කතා නොකර හඬ නගයි
අත් දෙකකින් මග පෙන්වයි
උදේ සිටන් රෑ වෙන තුරු
හැමෝට ම උදවු කරයි

(1) දුරකථනය
(2) බිත්ති ඔරලෝසුව
(3) විදුලි පංකාව


05. පහත රූපයේ ඇති මේස් අතුරෙන් එකිනෙක ගැළපෙන මේස් යුගල කීයක එක්වරක දී වෙන් කර ගත හැකි ද?



(1) 5
(2) 6
(3) 7

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -


06. පහත සඳහන් සංඛ්‍යා රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව තෝරන්න.



(1) 32


(2) 36

(3) 41

07. 

රූපයේ දැක්වෙන ආකාරයට චතුස්තලය එහි සඳහන් කඩ ඉරි දිගේ කොටස් දෙකකට වෙන් කරන ලදී. එසේ නම් B කොටසෙහි ඇති ත්‍රිකෝණාකාර මුහුණත් ගණන කීය ද?

(1) 3 (2) 2 (3) 5

08. 

එකිනෙකට ගෑවෙන සේ පෙට්ටි කිහිපයක් පහත දැක්වේ. ඒ අනුව මුහුණත් අනෙක් පෙට්ටි සමඟ අවම ගැටීමක් දැකිය හැක්කේ මින් කුමන පෙට්ටියේ ද?

(1) D (2) H

(3) E

09. × × ×
× × ×
× × ×

පහත දැක්වෙන කතිර එකිනෙකට යා කරමින් ලබා ගත හැකි උපරිම සමචතුරස්‍ර ගණන කීය ද?

(1) 5

(2) 6


(3) 7

10. ක්‍රිකට් පුහුණුවීම් කටයුතු සඳහා එක්තරා දිනයක දේශාන් රුවන්ට වඩා මිනිත්තු 15 ක් ප්‍රමාද වී ක්‍රීඩා පිටියට පැමිණියේ ය. එහෙත් ඔහු ධනුකට වඩා මිනිත්තු 10 ක් කලින් පැමිණියේ ය. දේශාන් පෙරවරු 8.30 ට පුහුණුවීම් කටයුතු සඳහා පැමිණුනේ නම් රුවන් සහ ධනුක පුහුණුවීම් සඳහා පැමිණි වේලාව පිළිවෙළින් වන්නේ,

(1) පෙරවරු 8.15 සහ පෙරවරු 8.40

(2) පෙරවරු 8.20 සහ පෙරවරු 8.40

(3) පෙරවරු 8.10 සහ පෙරවරු 8.20

11. 

දී ඇති කොටු දැලෙහි සෑම තීරුවකම හා පේළියකම අගය 22 ක් වන පරිදි 6, 8, 10, 12 යන ඉලක්කම් යොදා කොටු දැල සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව A සහ B අක්ෂරවලට අදාළව තිබිය යුතු සංඛ්‍යා දෙක පිළිවෙළින්,

(1) 12 සහ 8 (2) 8 සහ 12 (3) 10 සහ 12

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

12. බසයක සිටින පිරිමි මගීන් සංඛ්‍යාව එහි සිටින ගැහැනු මගීන් සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වේ. තවත් ගැහැනු 4 දෙනෙකු බසයට නැගුණහොත්, බසයේ සිටින පිරිමි සංඛ්‍යාව සහ ගැහැනු සංඛ්‍යාව සමාන වේ. එවිට බස් රථයේ සිටින මුළු මගීන් සංඛ්‍යාව කීය ද?


(1) 8 (2) 12 (3) 32

13. නාමල්ගේ නිවස පිහිටා ඇත්තේ කසුන්ගේ නිවසට නැගෙනහිරිනි. කසුන්ගේ නිවස පිහිටා ඇත්තේ රෂීන්ගේ නිවසට නැගෙනහිරිනි. ඒ අනුව,




(1) නාමල්ගේ නිවස පිහිටා ඇත්තේ රෂීන්ගේ නිවසට නැගෙනහිරිනි.


(2) රෂීන්ගේ නිවස නාමල්ගේ නිවස ආසන්නයේ පිහිටා ඇත.

(3) රෂීන්ගේ නිවස කසුන්ගේ නිවසට වඩා නාමල්ගේ නිවසට ළඟ ය.

14. 

කොටුව තුළ බෝල යොදා ඇති ආකාරය අනුව හිස් කොටුවට ගැළපෙන පිළිතුර තෝරන්න.

(1)  (2)  (3) 

15. 

පහත දැක්වෙන්නේ කුඩා ඝනක එකතු කර සාදන ලද රූපයකි. මෙම රූපයේ නිල් පාට තීන්ත ආලේප කර ඇති අතර රූපයේ තුන්පැත්තක් පමණක් තීන්ත ආලේප වූ කැට ගණන කීය ද?

(1) 16

(2) 12

(3) 18

16. නුවන් ඔහුගේ 10 වන උපන් දිනය සැමරුවේ දැනට අවුරුදු දෙකකට පෙර ය. එදිනට නයනිගේ වයස අවුරුදු 4 ක් විය. ඒ අනුව නුවන්ගේ හා නයනිගේ වයස පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අද නුවන්ගේ වයස නයනිගේ වයස මෙන් දෙගුණයකි.

(2) අද නුවන් නයනිට වඩා අවුරුදු තුනකින් වැඩිමහල් ය.

(3) තව අවුරුදු පහකින් නයනිගේ වයස අවුරුදු 10 ක් වේ.


17. ආශා. රවීෂා, නිෂාම්, විසල්, දිලුම් යහළුවෝ වෙති. විසල් උසින් අඩු ම ළමයා ය. ආශා විසල්ට වඩා උස ය. ඇය උසින් දෙවැනියා ය. දිලුම් ආශාට වඩා උස ය. නිෂාම් විසල්ට වඩා උස ය. නමුත් රවීෂාට වඩා මිටි ය. මොවුන් උස අනුව පෙළ ගැස්වූ විට මැදින් සිටින්නේ,

(1) රවීෂා (2) ආශා (3) නිෂාම්

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

18. මෙම පින්තූරයේ ඇති තරාදියේ දෙපැත්තේ තැටිවල ඇති ද්‍රව්‍යවල බර සමාන ය.

ඒ අනුව පහත දක්වා ඇති තරදියේ දෙපැත්තේ තැටිවල ඇති ද්‍රව්‍යවල බර සමාන වීම සඳහා ? ලකුණ දැක්වෙන හිස් තැටියට දැමිය යුතු ද්‍රව්‍ය අඩංගු පිළිතුර කුමක් ද? (මෙම පින්තූරයේ ඇති තරාදියේ දෙපැත්තේ තැටිවල ඇති ද්‍රව්‍යවල බර සමාන ය.)



(1) 

(2) 

(3) 

19. අවට පළාතක කුඹුරුයාය ගමේ ගෙවල්වල ගමනාගමනය සඳහා එක්කෝ යතුරු පැදියක් නැතිනම් පා පැදියක් තිබේ. මේ දෙක ම ඇති එක ම ගෙදරක්වත් නැත. අවට පළාතේ යතුරු පැදි ඇති ගෙවල් ඇත්තේ කුඹුරුයාය ගමේ පමණි. මේ තොරතුර අනුව ස්ථිර ලෙස කිව හැක්කේ කුමක් ද?

(1) අවට පළාතේ යතුරු පැදි ඇති ගෙවල් පා පැදි ඇති ගෙවල්වලට වඩා වැඩි ය.

(2) යතුරු පැදි හා පා පැදි දෙක ම ඇති ගෙවල් කිසිවක් කුඹුරුයාය ගමේ නැත.

(3) අවට පළාතේ පොහොසත් ගෙවල්වල යතුරු පැදි හා පා පැදි දෙක ම ඇත.

20. කුමාරි, නයනා, රුවනි, දේශානි හා චතුරි යහළුවෝ පස් දෙනා නිවාඩු කාලයේ තම ගුරුතුමියගේ නිවසට යාමට දවසක් කතා කරගත් ආකාරය පහත දැක්වේ.

කුමාරි :- අඟහරුවාදා, සිකුරාදා හෝ සෙනසුරාදා දින පමණක් හැකි බව පවසන ලදී.

නයනා :- බ්‍රහස්පතින්දා දින පමණක් සහභාගී විය නොහැකි බව පවසන ලදී.

රුවනි :- සඳුදා, බදාදා හා සිකුරාදා දින පමණක් සහභාගී විය හැකි බව පවසන ලදී.

දේශානි :- අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දින පමණක් සහභාගී විය නොහැකි බව පවසන ලදී.

චතුරි :- අඟහරුවාදා සහ බදාදා නොහැකි බව පවසන ලදී.

ඒ අනුව සියලු දෙනාට ම සහභාගී විය හැක්කේ,

(1) සිකුරාදා හෝ බදාදා දිනක පමණි. (2) සිකුරාදා දින පමණි.

(3) ඉරිදා දින පමණි.

21. අද මැයි 8 වන සෙනසුරාදා ය. තුසිතාගේ උපන්දිනය අදට යෙදී ඇත. මිහිරිගේ උපන්දිනය අනිද්දාට යෙදී ඇත. මිහිරිගේ උපන්දිනයට පසු දිනට පසු දින කුරුලුගේ උපන්දිනය යෙදී තිබේ. එසේ නම් කුරුලුගේ උපන්දිනය කවදා ද?

(1) මැයි 10 සඳුදා (2) මැයි 11 අඟහරුවාදා (3) මැයි 12 බදාදා


22.

1	2	3
4	5	6
7	8	9

මෙහි දැක්වෙන රූපයේ කොටු දැල කොටසකට සංඛ්‍යා තුන බැගින් හසුවන පරිදි කොටස් තුනකට වෙන් කරන ලදී. එසේ වෙන් කිරීමේ දී එක් කොටසක සංඛ්‍යාවල එකතුව 23 කි. එසේ නම් අනෙක් කොටස් දෙකේ එකතුව විය නොහැක්කේ,

(1) 16, 6 (2) 15, 7 (3) 12, 10

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -


23. 

තුෂාරි තම නිවසේ සිට ගෙවත්ත අවට ගමන් කළ ආකාරය පහත දැක්වේ. ඒ ඇසුරින් පිළිතුරු සොයන්න. තුෂාරි තම ගමනේ වැඩි ම වාර ගණනක් ගමන් කර ඇත්තේ කුමන දිශාවට ද?

(1) දකුණට

(2) උතුරට

(3) නැගෙනහිරට


24. 

මෙම රූපයේ සෑම අක්ෂරයක් ම එකිනෙකට යා වීමට තවත් රේඛා කොපමණ ප්‍රමාණයක් ඇඳිය යුතු ද?

(1) 18

(2) 20


(3) 40

25. 

පහත දැක්වෙන සරඹ සංදර්ශනයක පැත්තක දිග මීටර 3 ක් වන සමචතුරස්‍රාකාර හැඩයක් තුළ ළමුන් පෙළ ගස්වා ඇති ආකාරයකි. ඒ ආකාරයට පැත්තක දිග මීටර 7 ක් වන සමචතුරස්‍රාකාර හැඩයක් තුළ ළමුන් කී දෙනෙකු පෙළ ගැස්විය හැකි ද?

(1) 64 (2) 49 (3) 81

26. මේසයක් වටා පුටු තබා සිසුවියන් හතර දෙනෙක් පහත ආකාරයට වාඩි වී සිටිති. හදිස්සියේ ම පැමිණි ගුරුතුමිය මේ සිසුවියන් හතරදෙනා තම තමන්ට ප්‍රතිවිරුද්ධ පැත්තේ සිටින ළමයාත් සමඟ පැති මාරු කරන ලදී. එසේ නම් ගීතාගේ වම් පසින් සිටින්නේ කවරෙක් ද?



(1) ලීනා (2) සීතා (3) මීනා

27. එක්තරා දුරක් යෑමට පා පැදියක ගමන් කරන්නෙකු ගන්නා වේලාවෙන් 1/4 ක් ත්‍රීරෝද රථකරුවෙකුට ගත වේ. ඒ අනුව 30km ක් යාමට ත්‍රීරෝද රථකරුවෙකුට මිනිත්තු 20 ක් ගත වේ. පා පැදියක ගමන් කරන්නාට එම දුර යාමට ගත වන කාලය කොපමණ ද?

(1) පැය 1 කි. (2) පැය 1 මිනිත්තු 20 කි.

(3) පැය 1 මිනිත්තු 30 කි.


28. එක සමාන පරතරවලින් යුතු සංඛ්‍යා රටාවක මුල් ම සංඛ්‍යාව 6 වන අතර 6 වන සංඛ්‍යාව 26 වේ. මෙම සංඛ්‍යා රටාවේ 4 වන සංඛ්‍යාව කුමක් ද?

(1) 18 (2) 16 (3) 14

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

29. ටැංකියක ඇති ජලය ලීටර 30 කින් භාවිතය සඳහා ඉතිරිව තිබූ ජලය ප්‍රමාණය භාවිත කරන ලද ජලය ප්‍රමාණය මෙන් දෙගුණයකි. භාවිත කළ ජලය ප්‍රමාණය හා භාවිතයට ඉතිරිව ඇති ජලය ප්‍රමාණය සමාන වීමට නම් තවදුරටත් පාවිච්චි කළ යුතු ජලය ප්‍රමාණය කොපමණ ද?

(1) $15l$ (2) $10l$ (3) $5l$

30. 


කඩදාසිය මතින් පැන්සල ඉවතට නොගෙන එක ම මාර්ගයේ එක්වරකට වඩා නොයන සේ මෙම රූපය ඇඳීමට අවශ්‍ය වේ. රූපය ඇඳීම ආරම්භ කළ යුත්තේ කුමන ස්ථානයෙන් ද?

(1) P


(2) Q

(3) R

31. සමචතුරස්‍රයක හැඩය ඇති කඩදාසියක් පළමු රූපයේ දැක්වේ. එහි හරි මැද වෘත්තාකාර සිදුරක් ඇත. රූපයේ දැක්වෙන පරිදි කඩ ඉරි දිගේ දෙවරක් නමනු ලැබේ. ඉන්පසු තුන්වන රූපයේ දැක්වෙන පරිදි දෙපැත්තට නවන ලද දාරයේ ඉහළින් කුඩා කොටසක් කපා ඉවත් කරනු ලැබේ. කඩදාසිය සම්පූර්ණයෙන් ම දිගහැරිය විට දැකිය හැකි සිදුරු ගණන වන්නේ,



1 රූපය



2 රූපය



3 රූපය

(1) 3 (2) 4 (3) 5

32. 2024 වර්ෂයේ ජනවාරි පළවෙනිදා ඉරිදා දවසක් බව නිමාලි ප්‍රකාශ කළ ය. ඇය සමඟ සිටි කමනි, නිෂාදි සහ සුමේදා කරන ලද ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒ අනුව නිමාලිගේ ප්‍රකාශය හා ගැළපෙන නිවැරදි ප්‍රකාශයන් ප්‍රකාශ කර ඇත්තේ කවුරුන් ද?

කමනි ⟶ 2023 වර්ෂයේ මැද දවස සෙනසුරාදාවකි.

නිෂාදි ⟶ 2025 වර්ෂයේ මැද දවස අඟහරුවාදා දවසකි.

සුමේදා ⟶ 2024 වර්ෂයේ දෙසැම්බර් 31 ඉරිදාවකි.

(1) කමනි සහ සුමේදා පමණි.

(2) කමනි සහ නිෂාදි පමණි.

(3) කමනි, නිෂාදි, සුමේදා තිදෙනාගේ ම ප්‍රකාශ නිවැරදි ය.

33. මගේ වයස අවුරුදු 16 කි. එය මගේ නංගීගේ වයස මෙන් සිවු ගුණයකි. තව අවුරුදු 10 කින් මගේ සහ නංගීගේ වයස්වල එකතුව කීය විය හැකි ද?

(1) අවුරුදු 30 (2) අවුරුදු 40 (3) අවුරුදු 36

34. පහත හිස්තැනට ආ යුතු පිළිතුර වන්නේ,

1634	59
4689	1314
5387	1211
7849	.....

(1) 1615

(2) 1612

(3) 1216

35. පරිප්පු 8kg ක සහ සීනි 2kg ක මිල රුපියල් 420 කි. පරිප්පු 2kg ක මිල සීනි 1kg ක මිලට සමාන ය. එසේ නම් පරිප්පු 1kg ක් සහ සීනි 1kg ක මිල කීය ද?

(1) රුපියල් 70 (2) රුපියල් 105 (3) රුපියල් 140

36. සමාන්තර පන්ති 4 ක් සහිත පාසලක 3, 4 හා 5 ශ්‍රේණිවල සිසුන් සිටියේ පිළිවෙළින් 165, 152 හා 157 වශයෙනි. මෙම ශ්‍රේණි තුන අතරින් එක් ශ්‍රේණියක සමාන්තර පන්ති හතරේ ම සිටියේ සමාන ළමුන් ප්‍රමාණ බැගින් ය. එම පන්තිය වන්නේ,

(1) 3 ශ්‍රේණිය (2) 4 ශ්‍රේණිය (3) 5 ශ්‍රේණිය

37. අඹ ගෙඩියක සහ ඇපල් ගෙඩියක මිල රුපියල් 140 කි. අඹ ගෙඩි දෙකක සහ ඇපල් ගෙඩියක මිල රුපියල් 190 කි. අඹ ගෙඩි තුනක සහ ඇපල් ගෙඩියක මිල කීය ද?

(1) රුපියල් 260 (2) රුපියල් 220 (3) රුපියල් 240

38. දිනක්ෂි හා සරසි ඉපදුණේ එක ම අවුරුද්දෙ වුවත් සරසි දින දෙකකින් වැඩිමහල් ය. නුවනි, දිනක්ෂිට වඩා බාල නමුත් සයුනිට වඩා වැඩිමහල් ය. මේ අය අතරින් බාල ම තැනැත්තිය කවු ද?

(1) සයුනි (2) නුවනි (3) දිනක්ෂි

39. නුවන් උපත ලබන විට ඔහුගේ මවගේ වයස අවුරුදු 25 ක් විය. ඔහුගේ පියා මවට වඩා අවුරුදු 3 කින් වැඩිමහල් අයෙකි. ඒ අනුව නුවන්ට අවුරුදු 3 ක් වන විට ඔහුගේ පියාගේ වයස කීය ද?

(1) අවුරුදු 30 යි. (2) අවුරුදු 31 යි. (3) අවුරුදු 28 යි.

40. රුපියල් 100 ක මුදල් නෝට්ටුවක් කාසි හා නෝට්ටු යන වර්ග දෙක ම ලැබෙන පරිදි මාරු කිරීමේ අවම නෝට්ටු හා කාසි සංඛ්‍යාවක් ලැබිය හැකි අවස්ථාව,

(1) නෝට්ටු 3 යි, කාසි 1 යි.

(2) නෝට්ටු 3 යි, කාසි 2 යි.

(3) නෝට්ටු 2 යි, කාසි 0 යි.

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 04

II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.06.23 පෙ.ව. 9.30 සිට පෙ.ව. 10.45 [දෙවැනි පිටුව බලන්න.

01. පහත දැක්වෙන ඡේදය කියවන්න. ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.

එක ම ගමේ පදිංචිව සිටින අමිත සහ සමිත කුඩා කල සිට ම කලණ මිතුරන් වෙති. ගමේ දියඇල්ල අසල ඔවුන්ගේ නිවෙස් ඉදි කර තිබුණු අතර දියඇල්ල වටා සල් ගස් කිහිපයක් තිබූ නිසා ඔවුන් පදිංචිව සිටි ප්‍රදේශයට ගම්මු "සල් අරණ" යැයි කියති.

සමිතගේ ගෙවත්තේ සශ්‍රීක ලෙස වැඩුණු බොහෝ ගස් ඇත. තල්, කිතුල්, පොල්, කොස්, කෙසෙල්, පුවක් ආදිය ඉන් කිහිපයකි. සමිතගේ නිවස ඉදිරිපස වැට අයිනේ විශාල දූරියන් ගසකි. දූරියන් ගෙඩි සෑදෙන කාලෙට ගමේ බොහෝ දෙනෙක් දූරියන් ඇහිඳීමට ගස ළඟට පැමිණෙති.

(i) ඡේදයේ සඳහන් අන්දමට කලණ මිතුරෝ කවුරුන් ද? .....

(ii) ඔවුන්ගේ නිවෙස් ඉදිකර තිබුණේ කොහේ ද? .....

(iii) ඔවුන් පදිංචිව සිටි ප්‍රදේශයට ගම්මු කී නම කුමක් ද? .....

(iv) තල්, කිතුල්, පොල් ආදිය ගස් තිබුණේ කොහේ ද?

.....

(v) විශාල දූරියන් ගස ඇත්තේ කොහේ ද?

.....

(vi) 'පිටුපස' යන්නට විරුද්ධාර්ථ පදයක් මෙම ඡේදයේ සඳහන් වේ එය කුමක් ද?

.....

(vii) තාලුජ අක්ෂරයක් සහිත වචන කිහිපයක් ඡේදයේ සඳහන් වේ. එම වචනවලින් එක් වචනයක් ලියන්න. .....

02. පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) මම දිනපතා ප්‍රවෘත්ති ..... (ඇසුවෙමි / ඇසුවෙමු)

(ii) ඇතින්න සහ අලි පැටියා කැලේට ..... (යයි / යති)

(iii) ඇය පිරිසිදු ජලය පානය ..... (කළා ය / කළේ ය)

(iv) අම්මා කාරුණිකව ..... (කතා කළෝ ය / කතා කළා ය)

(v) කඩදාසි ඔරුව වතුරේ ..... (පාවෙයි / පාවෙති)

03. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(i) ඔවුහු පේළියට ගමනේ යෙදෙති. - .....

(ii) අපි යහපත් මිතුරු ඇසුර පතමු. - .....

04. පහත සඳහන් එක් එක් නාමපදය අයත්වන නාම පද වර්ගය තිත් ඉර මත ලියන්න.

(i) කොළඹ - ..... (ii) සීනි - .....

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

05. පහත දැක්වෙන එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන දෙක බැගින් ඇත. එම වචන පමණක් නිවැරදි කර අදාළ තිත් ඉරි මත ලියන්න.

(i) කුමාරි මුක සෙවුබ්‍යය පිළිබඳව කවි නිර්මාණය කළා ය.

.....

(ii) කමල් බණිජ සම්පත් මද්‍යස්ථානයට ගියේ ය.

.....

06. යුගල පද සම්පූර්ණ කරන්න.

(i) අහල ..... (ii) ..... මුල්ලක්

07. පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

අපේ පුතා කොච්චර හොඳ ද උදෙන් ම නැඟිටලා පාඩම් වැඩ අම්මා පැවසුවා ය

08. පහත වචන නිවැරදිව ගළපා වගන්තිය නැවත ලියන්න.

කරමු / සාහිත්‍යය / අපි / නාට්‍යයක් / ඉදිරිපත් / සමිතියේ දී

.....

09. දී ඇති ආප්තෝපදේශයේ අදහස හිස්තැන මත ලියන්න.

උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා.

.....

(ලකුණු 24)


10. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) do / live? / Where / you - .....


(ii) am / I / going / the / to / library - .....

11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i)



(ii)



12. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

(i) Roots - ..... (ii) Spoon - .....

13. "පැන්නිරණ්ඩු මණී" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මෙන්න වතුර බොන්න. - .....

(ලකුණු 8)

15. | 7 | 0 |
|---|---|
| 4 | 9 |

පහත කොටුව තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි ඉලක්කම් හතරේ කුඩා ම සංඛ්‍යාව සහ විශාල ම සංඛ්‍යාව අතර වෙනස කීය ද? .....

16. | 28 195 |
|---|

කොටුව තුළ ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.....

17. 35798, 35695, 35907 සංඛ්‍යා තුන අවරෝහණ පිළිවෙළට ලියන්න.

.....

18. සංඛ්‍යා රටාවේ ඊළඟට එන සංඛ්‍යා දෙක ලියන්න.


2, 4, 8, 16, 32, ..., ...

19. එක් අයෙකුට 4 බැගින් පොත් 208 ක් සිසුන් කී දෙනෙකුට ලබා දිය හැකි ද?

.....

20. $\frac{8}{10}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....

21. පොල් වතු දෙකකින් කඩන ලද පොල් 2676 ක් සහ 2879 කින් පොල් ගෙඩි 3878 ක් විකුණුවේ නම් ඉතුරු පොල් ප්‍රමාණය කොපමණ ද? .....

22. 

රූපයේ ඇති A භාජනයේ ජලය ලීටර 2 ක් ද B භාජනයේ ජලය 850ml ක් ද ඇත. භාජන දෙකෙහි ම ඇති ජල ප්‍රමාණය සමාන වීමට A භාජනයෙන් B භාජනයට දැමිය යුතු ජල ප්‍රමාණය කොපමණ ද? .....

23. මල්ලක හාල් 18kg ක් තිබූ අතර එයින් 9kg 850g ක් විකුණන ලදී. ඉතිරි හාල් ප්‍රමාණය කොපමණ ද? .....

24. (i) ත්‍රිකෝණාකාර මුහුණත් 4 ක් ඇති ඝනවස්තුවේ නම කුමක් ද? .....

(ii) එහි ඇති ශීර්ෂ සහ දාර ගණනේ එකතුව කීය ද? .....

❖ **වෙළඳසැලක ප්‍රදර්ශනය කර ඇති මිල දර්ශනයක් පහත දැක්වේ. එම මිල දර්ශනය අනුව 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

ද්‍රව්‍යය	1kg ක මිල	
	රුපියල්	සත
කඩල	260	00
කරවල	820	00
අල	290	00
පරිප්පු	420	00


25. අල 3kg ක් සහ කරවල 200g ක් මිල දී ගත් අයෙකු ගෙවිය යුතු මුදල කීය ද? .....

26. පරිප්පු 250g ක් සහ කඩල 500g ක් ගත් අයෙකු එම මුදල ගෙවීම සඳහා රුපියල් 500 ක නෝට්ටුවක් දුන්නේ නම් ලැබෙන ඉතිරි මුදල කීය ද? .....

27. මිනිසෙක් 20km දුරකින් 11km 80m ක දුරක් බසයෙන් ද, ඉතිරි දුර ත්‍රීරෝද රථයෙන් ද යන ලදී. ඔහු ත්‍රීරෝද රථයෙන් ගමන් කළ දුර කොපමණ ද? .....

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

28. සිසුන් කණ්ඩායමක එක් එක් සිසුවා වඩාත් ම කැමති වාහන පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දක්වා ඇත. නමුත් බස් රථවලට කැමති සිසුන් පමණක් ප්‍රස්තාරයේ ඇඳ දක්වා නැත.



(i) වෑන් රථවලට වඩා කාර් රථවලට කැමති සිසුන් ගණන කීය ද?

.....

(ii) කණ්ඩායමේ සිසුන් 70 ක් සිටී නම් බස් රථවලට කැමති සිසුන් ගණන ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

29. එක්තරා පාසලක ශිෂ්‍ය නායක උත්සවය පැය 2 මිනිත්තු 45 ක කාලයක් පවත්වන ලදී. එය අවසන් වූ වේලාව පස්වරු 12.15 නම් එම උත්සවය ආරම්භ කළ වේලාව කීය ද?

.....

(ලකුණු 30)

❖ අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.

30. පහත ඒවා අතරින් රාත්‍රී කාලයේ පත්‍ර හැකිලෙන ශාකවලට අයත් වන්නේ,

1. කරපිංචා, මුරුංගා
2. කතුරුමුරුංගා, නිදිකුම්බා
3. කරපිංචා, නිදකුම්බා

31. ආහාර ගැනීමේ දී යහපුරුදුවලට අදාළ නොවන කරුණක් වන්නේ,

1. අවශ්‍ය ප්‍රමාණය පමණක් බෙදා ගැනීම.
2. ඉවතලන කොටස් බිම නොදමා පසෙක තැබීම.
3. දේශීය ආහාර පමණක් ගැනීම.

32. වර්ෂාව සමඟ අකුණු සැර ඇතිවන විටෙක ආරක්ෂාව සඳහා අප විසින් ගත යුතු නිවැරදි ක්‍රියාමාර්ගය කුමක් ද?


1. නිවස තුළ ම රැඳී සිටීම.
2. ලෝහ වර්ග ඇල්ලීමෙන් වැළකී සිටීම.
3. පොළොව සමඟ සම්බන්ධතාවලින් වැළකී සිටීම.

33. පිත්තල තහඩුවකට කාන්දම් කැබැල්ලක් සමීප කළ විට,

1. පිත්තල තහඩුවට කාන්දම් කැබැල්ල ඇලෙයි.
2. එක් කෙළවරක් ඇලෙන අතර අනෙක් කෙළවර ඈත් වෙයි.
3. පිත්තල තහඩුව හා කාන්දම් කැබැල්ල අතර කිසිදු වෙනසක් සිදු නොවේ.

34. බස් නැවතුමක නතර කළ බස්රියකින් බැසගත් මගියෙකු බසය ඉදිරියෙන් පාර හරහා පැනීම අනතුරුදායක වන්නේ,

1. දකුණු පසින් එන වාහන පැහැදිලිව නොපෙනෙන නිසා ය.
2. වම් පසින් එන වාහන පැහැදිලිව නොපෙනෙන නිසා ය.
3. මාර්ගයේ දෙපැත්ත ම පැහැදිලිව නොපෙනෙන නිසා ය.

35. 

සිසුන් කණ්ඩායමක් එකතු වී පහත ඇටවුම සෑදූ අතර ඇණයේ හිස වෙතට අල්පෙනෙතක් ළං කළ විට එය ඇණයේ ඇලුණි. එසේ නම් ඇණය සාදා ඇති ද්‍රව්‍ය විය හැක්කේ,

1. ඇලුමිනියම්
2. යකඩ
3. ප්ලාස්ටික්


36. පහන් තිරයක් දිගේ ඉක්මනින් ම ඉහළට ගමන් කරන තෙල් වර්ගය වන්නේ,

1. පොල්තෙල්
2. එළඟි තෙල්
3. භූමිතෙල්

37. පුරුක් පණුවාගෙන් හානි සිදුවන්නේ,

1. පතෝල
2. ගොයම්
3. කුරක්කන්

38. ගල පහසුවෙන් පෙරළීමට දණ්ඩ අල්ලාගත යුතු වඩාත් ම සුදුසු ස්ථානය දැක්වෙන රූපය වන්නේ,

1. 
2. 
3. 

39. 

අයඩීකරණය කරන ලද ලුණු පැකැට්ටුවක පහත සඳහන් සංකේතය දක්වා ඇත.

1. නළ ජලය යොදා ගැනීමෙන් වළකින්න.
2. නොසෝදා පාවිච්චි කරන්න.
3. තෙතමනය ඇති තැනක නොතබන්න.

40. ශරීර වර්ධනය සඳහා වැඩි බලපෑමක් ඇති කරනු ලබන ආහාර යුගලය වන්නේ,

1. එළකිරි සහ පිට්ටු
2. බිත්තර සහ කුරහන් රොටී
3. මුං ඇට සහ සෝයා බෝංචි

41. ඈතින් ඇති ගොදුරු දැක අල්ලා ගැනීමට වඩාත් ම හැකියාව ඇති පක්ෂියෙකු වන්නේ,

1. කොකා
2. උකුස්සා
3. රාජාලියා

42. අඹ, ගම්මාලු, පොල් යන බීජ වර්ග ව්‍යාප්ත වන්නේ පිළිවෙළින්,


1. සතුන්, සුළඟ හා ජලය මගිනි.
2. සුළඟ, ජලය හා සතුන් මගිනි.
3. පිපිරීම, සුළඟ හා ජලය මගිනි.


43. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ජලය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,


1. ජලයට නිශ්චිත හැඩයක් නොමැත.
2. රත් කළ විට ජලය වාෂ්ප වී යයි.
3. උෂ්ණත්වය වැඩි වන විට, සීනි ජලයේ දිය නොවේ.

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

44. යකඩ ඇණය වෙත අල්පෙනෙති වැඩියෙන් ම ඇදී එන්නේ පහත සඳහන් කුමන ඇටවුමේ ද?

1. 

2. 

3. 

45. 

මෙම රූපයේ දැක්වෙන්නේ,

1. යාපහුව බලකොටුව
2. සීගිරිය
3. දළදා මාලිගාව

46. කිණිහිරය භාවිතා කරනු ලබන්නේ,

1. වඩු කර්මාන්තයේ දී
2. කම්මල් කර්මාන්තයේ දී
3. පතල් කර්මාණ්තයේ දී

47. ශාකයට මල්වලින් ඇති ප්‍රයෝජනයකි.

1. සුවඳ පැතිරීම.
2. ශාකයේ ආයු කාලය වැඩි කිරීම.
3. තම වර්ගයා බෝ කිරීමට උපකාරී වීම.


48. බස්නාහිර පළාතෙන් මුහුදට වැටෙන ගංගා දෙකකි.


1. මහවැලි, කැලණි
2. කැලණි, කළු
3. කැලණි, වලවේ


49. දියවැඩියා රෝගය පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු ආහාරය වන්නේ,


1. පාන්
2. කවුපි
3. නූඩ්ල්ස්

50. විදුලි පන්දමක් වඩාත් දීප්තිමත් ව දැල්වීම සඳහා වියළි කෝෂ නිවැරදි ව සම්බන්ධ කළ යුතු ආකාරය දැක්වෙන්නේ කුමන රූපයේ ද?

1. 

2. 


3. 

51. 

පහත දැක්වෙන මැහුම් ක්‍රමය වඩාත් සුදුසු වන්නේ,

1. ඉරුණු ඇඳුමක් මැසීමට
2. බොත්තම් කාසයක් මැසීමට
3. ඇඳුමක වාටියක් මැසීමට

52. මෙම ජල බඳුනේ ඇති A සහ B විය හැක්කේ පිළිවෙළින්,



1. යකඩ කැබැල්ලක් හා කාසියක්
2. ලී කැබැල්ලක් හා කාසියක්
3. ප්ලාස්ටික් කැබැල්ලක් හා පොල්තෙල් තට්ටුවක්

53. සන්නිවේදනය සඳහා යොදා ගැනෙන ජනප්‍රිය මුද්‍රිත මාධ්‍ය වන්නේ,

1. පුවත්පත
2. ගුවන්විදුලිය
3. රූපවාහිනිය

54. විශාල ටයර් පරණ වූ විට පරිසර හිතකාමී ලෙස ඒවාට කළ හැකි දෙයකි.

1. නිවෙස්වල වහලය උඩ දැමීම. 2. රාත්‍රී කාලයේ දී පුළුස්සා දැමීම.

3. ඉඩ අඩුතැන්වල බෝග වගා කිරීමට යොදා ගැනීම.

55. අප සතුන්ට හිංසා නොකළ යුත්තේ,

1. සතුන්ගෙන් අපට පාඩම් ඉගෙන ගැනීමට ඇති නිසා ය.

2. සතුන්ගෙන් ප්‍රයෝජන ගැනීමට ඇති නිසා ය.

3. සතුන් ද අප මෙන් තම ජීවිතයට ආදරය කරන නිසා ය.

56. විටමින් D බහුලව අඩංගු ආහාරයක් වන්නේ,

1. නෙල්ලි 2. කිරි 3. බත්

57. පස සරු කිරීම, අහිතකර කෘමීන් ආහාරයට ගැනීම, මල් පරාගනයට උපකාරී වීම යන බෝග වගාවට හිතකර තත්ත්ව ප්‍රධාන වශයෙන් සිදු කරන සත්ත්වයන් පිළිවෙළින්,

1. ගැඩවිලා, බකමූණා සහා මී මැස්සා 2. පුරුක් පණුවා, දළඹුවා සහ බඹරා

3. ගැඩවිලා, සමනලයා, මී මැස්සා

58. තිරස් ව එල්ලා ඇති දණ්ඩ චුම්බකයක් නිශ්චලව තිබෙන විට යොමුවන දිශා මොනවා ද?

1. නැගෙනහිර - බස්නාහිර 2. ඊසාන - නිරිත 3. උතුර - දකුණ

59. කුසගින්න නොදැනීම සහ තුවාල ඉක්මණින් සුව නොවීම රෝග ලක්ෂණ ඇති වන්නේ පිළිවෙළින්,

1. විටමින් B සහ විටමින් C ඌනතාවය

2. විටමින් A සහ විටමින් C ඌනතාවය

3. විටමින් D සහ විටමින් A ඌනතාවය

(ලකුණු 30)

60. මේ දිනවල ශීඝ්‍රයෙන් පැතිර යන ඩෙංගු උවදුර රට ම ගිල ගනිමින් පවතින බව අප සැම දන්නා කරුණකි. "ඩෙංගු උවදුරෙන් ආරක්ෂා වීමට අපට කළ හැකි දේ" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි **3ක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. .....

.....

2. .....

.....

3. .....

.....

(ලකුණු 6)



සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය



ප්‍රශ්න පත්‍ර අංක 04

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර
01	(1)
02	(2)
03	(3)
04	(2)
05	(3)
06	(2)
07	(2)
08	(3)
09	(2)
10	(1)
11	(3)
12	(2)
13	(1)
14	(3)
15	(2)
16	(1)
17	(1)
18	(2)
19	(2)
20	(2)

ප්‍රශ්න අංකය	පිළිතුර
21	(3)
22	(2)
23	(2)
24	(2)
25	(1)
26	(3)
27	(2)
28	(1)
29	(2)
30	(2)
31	(1)
32	(2)
33	(2)
34	(2)
35	(2)
36	(2)
37	(3)
38	(1)
39	(2)
40	(1)

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි. -